යොමු අංකය: 34/07/029/0001/002 2018 ජුලි 25

චක්‍රලේඛ අංකය: ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 03/2018

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිත්ව ආයතන වෙත,

## ලංකාසෙට්ල් පද්ධතියේ දෛනික කාලසටහන සංශෝධනය කිරීම

(1) 2018 අගෝස්තු 01 වැනි දින සිට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CAS) සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CEFTS ) සැසි වාර හතරක් (4) ක්‍රියාත්මක කරනු ඇත. එක් එක් සැසිවාරය සඳහා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමේ හා තත්කාලීන දළ පියවීම් පද්ධතියේ අරමුදල් පියවීමේ වේලාවන් පහත දක්වා ඇත.

| ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමේ සැසි වාර | තත්කාලීන දළ පියවීම් පද්ධතියේ පියවීම් වේලාව - CAS | තත්කාලීන දළ පියවීම් පද්ධතියේ පියවීම් වේලාව - CEFTS |
|---|---|---|
| චක්‍ර 1 (1400 පැය - 0700 පැය පසු දින) | 0845 පැය | 0900 පැය |
| චක්‍ර 2 (0700 පැය - 1000 පැය) | 1100 පැය | 1115 පැය |
| චක්‍ර 3 (1000 පැය - 1200 පැය) | 1300 පැය | 1315 පැය |
| චක්‍ර 4 (1200 පැය - 1400 පැය) | 1500 පැය | 1515 පැය |

(2) ඒ අනුව, 2018 අගෝස්තු 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, 2013 අගෝස්තු මස නිකුත් කරන ලද ලංකා සෙට්ල් පද්ධති රීති 2.1 සංස්කරණයෙහි 4 වැනි වෙළුමෙහි 1.2 වගන්තියෙහි දැක්වෙන දෛනික මෙහෙයුම් කාලසටහන පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| වේලාව | මෙහෙයුම | කාර්යයන්/ගනුදෙනු |
|---|---|---|
| 0630 පැය | පද්ධතිය ආරම්භ කිරීම | තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පද්ධතිය ආරම්භ කිරීම |
| 0730 පැය සිට 0800 පැය දක්වා | දිනයේ ආරම්භක සැකසුම් කටයුතු | සුරැකුම්පත් සඳහා වන නිල මිල ගණන් යාවත්කාලීන කිරීම සහ දවස තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සඳහා සුරැකුම්පත් හිමිකාරිත්වය සලකුණු කිරීම |
| 0800 පැය | ලංකාසෙට්ල් පද්ධතිය ගනුදෙනු සඳහා විවෘත කිරීම | ගනුදෙනු ආරම්භ කිරීම සඳහා පද්ධතිය විවෘත කිරීම |
| 0800 පැය | දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්/ ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් ස්වයංක්‍රීයව පියවීම | දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා දීම සහ විවට වෙළඳ කටයුතු ආශ්‍රිත ප්‍රතිමිලදී ගැනීම්වල සහ නිත්‍ය තැන්පතු පහසුකම් වල දෙවැනි පාදයට අදාළ ආපසු ගෙවීම් කටයුතු |
| 0815 පැය | දිනය ආරම්භයේ කරන කල්පිරීම්/ පොලී ගෙවීම් ගොනු කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල්පිරීම් | කල්පිරුණු සුරැකුම්පත්වලට අදාළ පියවීම්/ සුරැකුම්පත් කූපන් සඳහා ගෙවීම්, ලංකාසෙට්ල් පද්ධතියේ ගාස්තු/ දඩ මුදල් අය කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල්පිරීම් |
| 0830 පැය | ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම | ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි පළමු වන චක්‍රය /ප්‍රධාන නිෂ්කාශන පද්ධතියට අදාළ ශුද්ධ නිෂ්කාශන ශේෂයන් පියවීම |
| 0830 පැය | ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම්/ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසිය/ දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම | ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම් පියවීම<br>දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය සහ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසියෙහි ප්‍රථම පාදය |

| | | |
|---|---|---|
| 0845 පැය | ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම | ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය |
| 0900 පැය | ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම | විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය |
| 1100 පැය | ප්‍රතිවිකුණුම් සහ ස්ථාවර ණය පහසුකමට අදාළ ආපසු ගෙවීම් | විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතිවිකුණුම්වල සහ නිත්‍ය ණය පහසුකම්වල ප්‍රතිවිකුණුම්වල දෙවන පාදයට අදාළ පියවීම |
| 1100 පැය | ලංකා ක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම | ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය |
| 1115 පැය | ලංකා ක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම | විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය |
| 1145 පැය | දිගුකාලීන ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය) | විවට වෙළඳ කටයුතු යටතේ දිගුකාලීන ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු |
| 1300 පැය | ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම | ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි තෙවන චක්‍රය |
| 1300 පැය | ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම | ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි දෙවන චක්‍රය |
| 1300 පැය | ප්‍රාථමික වෙන්දේසියකට අදාළ පියවීම් කටයුතු අවසන් කිරීම/කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය | ප්‍රාථමික වෙන්දේසියේ සුරැකුම්පත් පියවීම<br>කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දෙසිය පියවීම |
| 1315 පැය | ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම | විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය |
| 1315 පැය | කෙටි කාලීන ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය) | විවට වෙළඳ කටයුතු යටතේ කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු |
| 1445 පැය | ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම | පියවුම් නිෂ්කාශනය සහ ගැලපුම් නිෂ්කාශනය |
| 1500 පැය | ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම | ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි තෙවන චක්‍රය |
| 1500 පැය | ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම | ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි හතරවන චක්‍රය |
| 1500 පැය | තුන්වන පාර්ශවීය ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම | අන්තර් බැංකුවලට අදාළ MT2XX කාණ්ඩයේ පණිවුඩ හැර එම දින තුළ තුන්වන පාර්ශ්වයේ අළුත් ගනුදෙනු (T + O) සඳහා පද්ධතිය වැසීම |
| 1515 පැය | ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම | විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන චක්‍රය |
| 1545 පැය | සහභාගිතත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම අවසන් කිරීම | සහභාගිත්ව ආයතන විසින් ප.ව. 3.45 න් පසු දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ප්‍රතිමිලදී ගැනීම සිදු නොකළ යුතුයි. |
| 1600 පැය | නිත්‍ය තැන්පතු පහසුකම් | නිත්‍ය තැන්පතු පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම |
| 1615 පැය | නිත්‍ය ණය පහසුකම් | නිත්‍ය ණය පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම |
| 1615 පැය | දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු ගෙවීම | දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු අය කර ගැනීම |
| 1630 පැය | ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම | පද්ධතිය විසින් මෙම වේලාවෙන් පසුව වැඩිදුරටත් ගනුදෙනු භාර නොගනී. ගනුදෙනු සඳහා පද්ධතිය වැසීමෙන් පසු එතෙක් පෙළගැසී තිබුණු ගනුදෙනු කිසිවක් වේ නම් ඒවා නතර කිරීම හා අවලංගු කිරීම සිදුවේ. |

| | | |
|---|---|---|
| 1630 පැය සිට 1700 පැය දක්වා | දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු | දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු<br>උදා: වාර්තා පිළියෙළ කිරීම, අදාළ ගොනු පොදු ලෙජරය වෙත යොමු කිරීම, ලංකාසෙටිල් ගාස්තු අය කිරීම සඳහා අදාළ දත්ත පිළියෙළ කිරීම සහ මුද්‍රණ වාර්තා සැකසීම අයත් වේ. |
| 0500 පැය | පද්ධතිය සංවෘත කිරීම | තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියට අදාළ සියලුම මෘදුකාංග වසා දැමීම. දත්ත වෙනත් දත්ත ගබඩාවක සටහන් කිරීම |

(3) සහභාගිත්ව ආයතන පිරික්සුම් නිකේතනය මගින් ඔවුන්ගේ පියවීම් ගිණුම් නිරීක්ෂණය කළ යුතු බවත්, බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනු තත්කාලීන දළ පියවීම් පද්ධතිය වෙත පියවීම සඳහා යොමු කරන අවස්ථාවේ දී තම පියවීම් ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් ශේෂයන් පවත්වා ගැනීමට වගබලා ගත යුතු බවටත් සහභාගිත්ව ආයතන වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

ඩී. කුමාරතුංග
**අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්**